**පොලිස් ත්‍යාග අරමුදල - 2018**

------------------------------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

-----------------------------------

පොලිස් ත්‍යාග අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

-------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය සෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා වෙනත් ලියකියවිලි ඵලදායි ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාල ලිඛිත නීතියකට හා අරමුදල විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හා විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාල සීමාව තුල සහ අදාල නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාල එකතුව රු.18,151,675 ක දඩ මුදල 2019 වර්ෂය තුල ලැබී තිබුණි. එසේ වුවද එම වටිනාකම ලැබිය යුතු දඩ මුදල් ලෙස හඳුනාගෙන 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා නොතිබුණි. | නිරීක්ෂණ සමඟ එකඟ වේ. | වර්ෂය අග ලැබිය යුතු ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දඩ මුදල් ආදායම හා ලැබිය යුතු උසාවි දඩ මුදල් රු.7,280,501 කින් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. | නිරීක්ෂණ සමඟ එකඟ වේ. | වර්ෂය අග ලැබිය යුතු ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාල 5 කින් විගණනය වෙත සෘජුව ලබාදී තිබූ රථවාහන දඩමුදල් ආදායම් වාර්තා අනුව 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රථ වාහන දඩ මුදල් එකතුව රු.5,055,840 ක් හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි. | නිරීක්ෂණ සමඟ එකඟ වේ. | වර්ෂය අග ලැබිය යුතු ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |
| (ඈ) | නියැදි විගණන පරීක්ෂාවට අනුව පොලිස් කොට්ඨාශ 20 ක් විසින් ගෙවන ලද රු.815,500 ක් වූ අරමුදලේ පරිපාලන කටයුතු සඳහා දැරූ වියදම, සාමාන්‍ය අග්‍රිම වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිරීක්ෂණ සමඟ එකඟ වේ. | පරිපාලන කටයුතු සඳහා දරන වියදම් න්‍යාග අග්‍රිමය යටතේ ගිණුම්ගත නොකල යුතුය. |

## 2.1 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (ආ) | පොලිස් අනුග්‍රාහක අරමුදලට දුන් අත්තිකාරම් රු.2,000,000 ක් වර්ෂ 18 කට වැඩිකාලයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. අනුමැතිය ලබාගෙන මෙම ගෙවීම් නිරවුල් කර ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (අ) | විශේෂ වැටලීම් සඳහා අරමුදලින් ත්‍යාග ගෙවීමේදී නඩු අවසන් වීමට පෙර සියයට 50 ක අත්තිකාරම් මුදලක් ගෙවනු ලබන අතර ඉතිරිය නඩුව අවසන් වීමෙන් පසුව ගෙවනු ලබයි. එසේ වුවද නඩු කටයුතු අවසන් නොවීම හේතුවෙන් ගෙවිය යුතු විශේෂ ත්‍යාග වටිනාකම රු.75,277,961 ක් වර්ෂ 01 ක සිට වර්ෂ 15 ක කාල පරාසයක් තුල ගෙවීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. නඩු කටයුතු අවසන් නොවීම හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී ඇත. | ගෙවිය යුතු විශේෂ ත්‍යාගයන්ට අදාල නඩු කටයුතු අවසන් වීමේ ප්‍රගතිය කෙරෙහි සුදුසු ක්‍රියාමාර්ග ගැනීම හා පසුවිපරම් කටයුතු සිදුකල යුතුය. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,065,029,245 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,663,672,230 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.401,357,015 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රථ වාහන දඩ මුදල් ලැබීම් රු.272,625,952 කින් වැඩිවීම හා ස්ථාවර තැන්පතු ආයෝජන පොලී ආදායම් රු.191,405,350 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී දිවයිනේ පොලිස් කොට්ඨාශ 42 කින් පොලිස් කොට්ඨාශ 28 ක පොලිස් ස්ථාන 288 කට අදාලව ලබා දුන් තොරතුරු අනුව බීමත් රියදුරන් 62,794 අත්අඩංගුවට ගෙන තිබූ අතර, අත්අඩංගුවට ගැනීම් 13,745 ක් ත්‍යාග | අරමුදලේ සංශෝධිත නියෝග 1990 දී ඡේද අංක 7 හා 8 අනුව ත්‍යාග මුදල් නිර්දේශ කිරීම සිදුව ඇත. මේ සම්බන්ධව විශේෂ අවධානය යොමු කර සියළුම පොලිස් ස්ථාන දැනුවත් කිරීමට කටයුතු කරමි. | එක සමාන රාජකාරී අවස්ථාවන් හිදී එම සියළු නිලධාරීන් දිරිගැන්වෙන පරිදි ත්‍යාග මුදල් ගෙවීම |

| | | | |
|---|---|---|---|
| | මුදල් ගෙවා තිබුණි. ඒ අනුව අත්අඩංගුවට ගැනීම් 49,049 ක් සඳහා ත්‍යාග මුදල් ගෙවා නොතිබුණ අතර එහි ප්‍රතිශතය සියයට 78 ක් විය. | | සිදුකල යුතුය. |

**5.** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයෝජනය කර ඇති ස්ථාවර තැන්පතු හා ඒ මත උපයා ඇති පොලී ආදායම ඉකුත් වර්ෂයේදී රු.මිලියන 8,123 ක් හා රු.මිලියන 819 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එම අගයන් පිළිවෙලින් රු.මිලියන 9,821 ක් හා රු. මිලියන 1,011 ක් දක්වා වර්ධනය වී තිබුණි. | නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. | අරමුදලේ ස්ථාවර තැන්පතු වටිනාකම හා ඒ මත පොලී ආදායම් වාර්ෂිකව වර්ධනය වන නමුත් අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටුකිරීමට ප්‍රමුඛතාවය හිමිවිය යුතුය. |
| (ආ) | 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා පිළිවෙලින් රු. මිලියන 433.47, රු. මිලියන 386.09, රු. මිලියන 325.67, රු. මිලියන 469.25, රු. මිලියන 819.73 හා රු. මිලියන 1,011.14 ක් බැගින් එකතුව රු.මිලියන 3,445.35 ක් ස්ථාවර තැන්පතු මත පොලී ආදායම් ලෙස උපයාගෙන තිබුණද මෙම ආදායම් අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා උපයෝජනය කරන්නේ කෙසේද යන්න පිළිබඳ තීරණයක් ගෙන නොතිබුණි. | නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. | ස්ථාවර තැන්පතු ආදායම් අරමුදල පිහිටවීමේ අරමුණ සඳහා යොදා ගන්නේ කෙසේද යන්න පිළිබඳ තීරණය කළ යුතුය. |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට ආරම්භ කිරීම සඳහා නියමිත ලිපි ලේඛන භාර දී තිබූ රු. මිලියන 410 ක ස්ථාවර තැන්පතුව එදින ආරම්භ නොකර 2019 ජනවාරි 01 දින ආරම්භ කිරීම නිසා සියයට 13.6 ක වාර්ෂික පොලී අනුපාතය යටතේ 2018 වර්ෂයට අදාලව අරමුදලට අහිමිව තිබූ ආයෝජන පොලී ආදායම රු.152,767 ක් විය. | 2018.12.31 දිනම චෙක්පත් නිකුත් නොකලහොත් තවත් දින කිහිපයක් ප්‍රමාද වීම නිසා අරමුදලට අහිමිවන ආදායම මෙම ප්‍රමාණයට වඩා වැඩි වන බැවින් උපරිම ලාභයක් ලැබෙනපරිදි කටයුතු කර ඇත. | ජංගම ගිණුමේ අතිරික්ත මුදල් පිළිබඳව පූර්ව අවබෝධයකින් කටයුතු කර නිවැරදි අවස්ථාවේදී ආයෝජන සිදුකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 අගෝස්තු 14 දින වවුචර් 03 ක් මගින් රු. 1,000,000 ක් වැටලීමට සම්බන්ධ පොලිස් නිලධාරීන්ට ත්‍යාග මුදල් නොගෙවා තොරතුරුකරුවන්ට (ඔත්තුකරුවන්ට) පමණක් ගෙවා තිබුණි. මෙම වවුචර් තුන මගින් ත්‍යාග මුදල් ගෙවීම හා අදාල ලේඛන ඉදිරිපත් කිරීම විශේෂ ත්‍යාග ගෙවීමේදී අනුගමනය කරන සාමාන්‍ය ක්‍රියා පටිපාටියෙන් බැහැරව සිදු කර තිබුණි. | ඔත්තුකරුවන්ට ත්‍යාග ගෙවීම අදාල කාර්ය අවසාන වූ විගස සිදුකල යුතුය. ඔත්තුකරුවන් මන්දෝත්සාහී වීම තුලින් ඉදිරියේදී තොරතුරු නොලැබීමට එය හේතුවක් විය හැකිය. | විශේෂ ත්‍යාග ගෙවීමේදී අනුගමනය කරන සාමාන්‍ය ක්‍රියාපටිපාටිය යටතේ ත්‍යාග ගොණු පිළියෙල කර විධිමත් පරිදි විශේෂ ත්‍යාග ගෙවීම් සිදුකල යුතුය. |

**6.** **අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂය සඳහා ක්‍රීඩා හා විනෝද කටයුතු, සුභසාධන කටයුතු හා බැරැක්ක ඉදිකිරීම් සඳහා පිළිවෙලින් රු. මිලියන 17.35, රු. මිලියන 17.35 හා රු. මිලියන 86.75 ක් ලෙස එකතුව රු. මිලියන 121.45 ක් වෙන්කර තිබුණි. එසේ වුවද එම ව්‍යාපෘති ඉටුකර නොතිබීම හේතුවෙන් නිලධාරීන්ගේ සුභසාධනයක් ඉටු වී නොතිබුණි. | අයවැය ඇස්තමේන්තුව සකස් කිරීමේදී මෙම කටයුතු සඳහා මුදල් වෙන් කිරීම සිදුකළද වර්ෂය තුල සුභසාධක කටයුතු සහ බැරැක්ක ඉදිකිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක නොවුණි. | අයවැය ඇස්තමේන්තුවට අනුව වර්ෂයේ ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ත්‍යාග ගෙවීම් සඳහා විශේෂ අග්‍රිමය යටතේ වියදම් දැරීමේදී ඇස්තමේන්තුගත වියදමට වඩා රු.26,859,813 ක්, එනම් සියයට 134 ක් වැඩියෙන් වියදම් දරා තිබුණි. තවද සාමාන්‍ය අග්‍රිමය යටතේ රු.110,905,658 ක් ද විනෝද අග්‍රිමය යටතේ රු.1,123,671 ක් හා රථ වාහන අග්‍රිමය යටතේ රු.100,618,155 ක් හා පොලිස්පති විශේෂ ත්‍යාග ගෙවීම් යටතේ රු.6,963,108 ක් වශයෙන් ඇස්තමේන්තුගත වියදමට වඩා අඩුවෙන් ප්‍රවර්තන වර්ෂය තුල වියදම් දරා තිබුණි. එය ප්‍රතිශතාත්මකව සියයට 15.84 ක්,14.05 ක්, 37.27 ක් සහ 8.70 ක් විය. | නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. | ඇස්තමේන්තු ඉක්මවා යැමේදී විධිමත් පරිදි සංශෝධන සිදුකර ගත යුතුය. |